**අම්බලන්තොට ප්‍රාදේශීය සභාව - 2021**

----------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

---------------

**1.1. තත්ත්වාගණනය කළ මතය**

------------------------------

අම්බලන්තොට ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට අම්බලන්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

--------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත්වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු. 3,052,538 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2022 වර්ෂයේ අවසන් ගිණුම මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | 1994 අංක 04 දරණ දකුණු පළාතේ මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥාප්තිය ප්‍රකාරව සභාවට නොලැබෙන ඉකුත් වර්ෂයන්ට අදාළ ප්‍රමාද කාලය වසර 02 ට වඩා වැඩි රු. 1,757,505 ක මුද්දර ගාස්තු ලැබිය යුතු ආදායමක් ලෙස වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.. |
| (ඇ) | ප්‍රාදේශීය සභාව විසින් දේශීය ණය සංවර්ධන අරමුදලින් ලබාගෙන තිබූ ණය මුදලින් සමාලෝචිත වර්ෂයේ අවසාන කාර්තු 03 සඳහා ගෙවිය යුතු රු. 1,680,918 ක් ජංගම වගකීමක් ලෙස හඳුනා නොගෙන ජංගම නොවන වගකීම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | | වගකීම් නිවැරදිව හඳුනා ගෙන ශේෂ පත්‍රය තුළ දැක්විය යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති වාහන පාරිභෝජ්‍ය ද්‍රව්‍ය තොගය සහ පාරිභෝජන ද්‍රව්‍ය තොගය පිළිවෙලින් රු. 41,751 ක් හා රු. 161,274 ක් ලෙස එකතුව රු. 203,025 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | තොග වෙනස නිවැරදි කිරීමට කටයුතු කරමි. | තොගය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී හියුම් පයිප්ප මිලදී ගැනීම සඳහා වැයකළ රු. 105,000 ක ප්‍රාග්ධන වියදම, පුනරාවර්තන වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි . | ඉදිරියේදී නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

**1.6.2 නොසැසඳුණු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් හිඟ වරිපනම් හා බදු රු.4,512,108 ක් වූ අතර ඊට අදාළ වරිපනම් හා බදු උපලේඛනය අනුව වටිනාකම රු.4,323,710 ක් වූයෙන් රු.188,398 ක අසමානතා පැවතුනි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම නිවැරදි කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.2,412,189 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.4,402,157 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| | සමාලෝචිත වර්ෂය සඳහා වරිපනම් ඒකක 3687 කින් ලැබිය යුතු රු. 3,350,438 ක වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර හිඟයෙන් රු. 403,402 ක් රාජ්‍ය ආයතන වලින් ලැබිය යුතු ශේෂයක් විය. | ඉතිරි හිඟ මුදල් අයකිරීම සඳහා ප්‍රාදේශීය සභා පනතින් පැවරී ඇති බලතල ප්‍රකාරව කටයුතු කරමි. | හිඟ බදු ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ආ) | **වෙනත් ආදායම්** | | |
| | රු.මිලියන 13 ක් වැය කර සංවර්ධනය කළ නෝනගම වෝටර්පාක් උද්‍යානය ටෙන්ඩර් කර බදුදීමට ක්‍රියා නොකර පෞද්ගලික පාර්ශවයකට ගාස්තු අයකර බෝට්ටු සේවාවක් පවත්වා ගෙන යමින් සභාවට කොමිස් ගෙවීමෙ පදනම මත අවසර ලබාදී තිබුණි. තවද සමාලෝචිත වර්ෂය තුළ රු. 890,500 ක ආදායමක් උපයා එයින් සියයට 10 ක මුදලක් සභාවට ගෙවා රු. 801,450 ක් පෞද්ගලික පාර්ශවයකට කිසිඳු වියදමක් නොදරමින් රැගෙන යාමට සභා කළමනාකාරීත්වය ඉඩදී | 2022 වර්ෂයේ සිට මෙම ස්ථානයෙන් අය කරන විනෝද බදු ප්‍රතිශතය 20% ක් දක්වා වැඩි කිරීමත්, 2023 වර්ෂය සඳහා ටෙන්ඩර් කර බදු දීමට කටයුතු කරමි. | සභාව සතු දේපල වලින් ආදායම් රැස් කිරීමට කටයුතු කල යුතුය. |

තිබීමෙන් සහා අරමුදලට රැස්කර ගතහැකිව තිබූ ආදායමක් අහිමි වන පරිදි කටයුතු කර තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කරුණු විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 අනාර්ථික ගනුදෙනු

--------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභා බල ප්‍රදේශයේ සිටින සෑම පවුලක් සඳහාම ප්‍රතිශක්ති වර්ධක ඖෂධ කට්ටලය බැගින් ලබාදීමට ඖෂධ කට්ටල 24,000 ක් නිපදවීමට සභා අරමුදලින් රු. 910,550 ක අමුද්‍රව්‍ය මිලදී ගෙන 2021 ජුනි 16 දින රන්න ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාවට භාරදීමෙන් පසු එම ආයතනයෙන් ඖෂධ පැකට් 4541 ක් පමණක් සභාවට ලබාදී තිබුණු අතර ඉතිරි පැකට් 19459 ක ප්‍රමාණය සභාව වෙත ලැබී නොතිබීම හේතුවෙන් අපේක්ෂිත අරමුණ ඉටුවී නොතිබුණි. | රන්න ආයුර්වේද බෙහෙත් ශාලාව විසින් සභාව වෙත ඖෂධ කට්ටල 4541 ක් ලබාදුන් බවත්, ඉතිරි ඖෂධ කට්ටල 19,459 සභාව වෙත කඩිනමින් ලබාදීමට කටයුතු කරන මෙන් දැනුම් දුන්නෙමි. | ප්‍රතිශක්ති වර්ධක ඖෂධ කට්ටල බෙදා හැරීම කඩිනමින් සිදු කල යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී ජංගම වෙළඳ කුටි 40 ක් රු. 9,948,000 ක වියදමින් ඉදිකර අවසන්ව තිබුණද ප්‍රතිලාභීන් හඳුනාගෙන එම වෙළඳ කුටි බෙදා දීමට කටයුතු කර නොතිබුණි. | ජංගම වෙළෙඳ කුටි ලබාදිය යුතු ප්‍රතිලාභීන් හඳුනා ගැනීමේ කටයුතු අවසන් කළ බවත්, ඉදිරියේදී ජංගම වෙළෙඳ කුටි බෙදාදීමට කටයුතු කරමි. | ප්‍රතිලාභීන් හඳුනාගෙන කඩිනමින් ජංගම වෙළඳකුටි බෙදා දීමට කටයුතු කළ යුතුය. |

**3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| බෝලාන පෙර පාසලේ සහ බටඅත පෙර පාසලේ වැසිකිළිය ඉදිකිරීම යන කර්මාන්ත දෙකෙහි වහළය ඉදිකිරීම සඳහා ආනයනික දැව යොදාගත් බව දක්වමින් රු. 382,156 ක් ගෙවීම් වාර්තාවට ඇතුළත් කර තිබුණද වහළය සඳහා යොදා තිබූ දැව ආනයනික දැව නොවුණි. | කොන්ත්‍රාත්කරුට එම අඩුපාඩුව නිවැරදි කිරීමට උපදෙස් දුන් බවත්, එය නිවැරදි නොකරන්නේ නම් වහලයේ යොදන ලද මිලිමීටර $50 \times 50$ දැව සඳහා සම්පූර්ණයෙන්ම අඩුකර ගෙවීමට කටයුතු කරමි. | කර්මාන්ත ගිවිසුම පරිදී අනුමත ප්‍රමිතියෙන් යුත් දැව යොදාගත යුතුය. |